සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01 ඔහු <u>ගිනි කන වෙළෙන්දකු</u> බව එදින වඩාත් තහවුරු විය.
(1) අව්වේ වැඩ කරන්නෙකු
(2) වෙළඳ බඩුවලින් ඉතා අසාධාරණ ලෙස ලාභ ගන්නෙකු
(3) දුක්මහන්සි වෙන අයකු
(4) සාධාරණ වෙළෙන්දෙකු

02 ස්වාමියා තමන්ගේ <u>අත් පා බැඳ</u> වැඩ ගන්නේ යැයි සමහර සේවකයෝ කියති.
(1) පහරදීම්වලට ලක්කොට (2) උසස්වීම් නොදී
(3) ඉල්ලීම් නොසලකා (4) ණය සහනාධාර නොදී

03 තාත්තා <u>නා කපන වැස්සේ</u> නිවසට පැමිණියේ ය.
(1) ඉතාමත් තද වැස්සේ (2) නා ගස් පවා කඩා වැටෙන තරම් වැස්සේ
(3) හෙමිහිට වහින වැස්සේ (4) කළුවර කපා වහින වැස්ස

- **අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04 භාෂාව යනු නිර්මාණකරුවාගේ සාහිත්‍යය ................................
(1) උපකරණය යි (2) තේමාව යි (3) පාඨයයි (4) මෙවලමයි

05 මේ නේවාසිකාගාරවල කටයුතු සම්පාදනය කරනු පිණිස නීතිරීති ................................ ද, ජෙනිංග්ස් මහතා විසින් සම්පාදනය කරන ලදී.
(1) කිහිපයක් (2) මාලාවක් (3) සම්පිණ්ඩනයක් (4) සමූහයක්

06 පූජාවලියෙන් මෙම පාඩමට ................................ ඇත්තේ ''සමමෙත් ආදී පූජා කතා'' නම් විසිවන වැනි පරිච්ඡේදයෙන් කොටසකි.
(1) ලබා ගෙන (2) අරගෙන (3) උපුටා ගෙන (4) යොමු කර

07 සෑම පදයක ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මොනරා, කනගාටුව, කොට්ඨාසය, විමර්ශනය
(2) උච්චාරණය, කණ්ඩායම, ප්‍රවිෂ්ට, හෙන්ඩුව
(3) කසළ, පතුල, අළුත්වැඩියාව, නිෂ්ඵල
(4) නළල, පාපිලි, සෙවණ, පරමාදර්ශය

08 පුරුද්ද, විරූඪ, මිනිත්තුව, චිත්‍ර යන වචනවල දෙවැනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඇදපිල්ල, දීර්ඝ ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල, රකාරාංශය
(2) කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, කෙටි ඉස්පිල්ල, රකාරාංශය
(3) කෙටි පාපිල්ල, දීර්ඝ ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල, රකාරාංශය
(4) කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, රකාරාංශය, කෙටි ඉස්පිල්ල

09 'උදක' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) කණ්ඨජ, ඕෂ්ඨජ, දන්තජ (2) ඕෂ්ඨජ, දන්තජ, මූර්ධජ
(3) තාලුජ, දන්තජ, කණ්ඨජ (4) ඕෂ්ඨජ, දන්තජ, කණ්ඨජ

10 අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) පොත, පැන, මකනය, පැන්සල (2) මරදන්කඩවල, මරදාන, යාපනය, වළස්මුල්ල
(3) පන්සල, පල්ලිය, කෝවිල, පාසල (4) කලිසම, ගවුම, සාරිය, සරම

11 උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ළමයා, ගැහැනියක, ගවයෙක්, කුරුල්ලෝ
(2) කම්කරුවෝ, අපි සතුන්, දෙවියෝ
(3) පක්ෂීහු, පාලකයෝ, ඔවුන්, ගොවීහු
(4) ගායිකාවක්, වෙළෙන්දෝ, මල්ලියෙක්, පිළිහුඩුවෙක්

12 ඇගේ දත් ''කොඳ කැකුළු'' මෙන් බබළයි. යන වාක්‍යයේ ''කොඳ කැකුළු'' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) ප්‍රථමා (2) කර්ම (3) කර්තෘ (4) කරණ

13 එම ''දරුදැරියෝ'' වෙහෙස මහන්සි වී මල් පාත්තිය සැකසූහ. මෙහි දරුදැරියෝ යන්න අයත් සමාසය කුමක් ද?
(1) විශේෂණ (2) අන්‍යාර්ථ (3) 'ද' කාරාර්ථ (4) විභක්ති

14 ''වර්ග+ඉක'' යන ප්‍රකෘතිය සහ ප්‍රත්‍ය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) වාර්ගික (2) වර්ගික (3) වර්ගයික (4) වාර්ගයික

15 මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් 'නොවන' පදයක් සහිත වරණය තෝරන්න.
(1) නිපාත - නිතර, අහෝ, පිණිස, හෙවත්
(2) පූර්ව ක්‍රියා - ගොස්, බලා, සහා, ලියා
(3) කෘදන්ත - නටන්නා, කියන, රකින්නී, නරඹන
(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා - කඩවයි, ලියවයි, දුවවයි, බලවයි

16 අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී නැති වරණය තෝරන්න.
(1) ඔහු දුවද්දී වැටුණි. (2) අද වැස්සොත් වැව පිරේවි
(3) හිරු නැගෙත නෙලුම් පිපේ (4) මගේ වැඩබලා මව සතුටු විය

- **17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

17 එය **අනුචිත** තීරණයකි.
(1) සුදුසු (2) ප්‍රමාණවත් (3) කාලෝචිත (4) නුසුදුසු

18 ඔහු **සියලඟ** දූවිලි තවරා ගනිමින් සෙල්ලම් කළේ ය.
(1) තමන්ගේ ළඟ (2) සීයා ළඟ (3) මුළු ශරීරය ම (4) පාදවල

19 එම **වෘත්තාන්තය** හරි ම රසවත් ය.
(1) කතාව (2) රවුම (3) පාඩම (4) ඡේදය

20 දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) ඔසරිය, ගවුම, සාය, හැට්ටය (2) කලිසම, සරම, කමිසය, බැනියම
(3) මාලය, මුද්ද, ඔරලෝසුව, කැඩපත (4) මල්, පහන්, හඳුන්කූරු, පහන්තිර

21 එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සකල - සියලු, රාවය - නද, මිත්‍රයා - සකි, තෙල් - තෛල
(2) පතළ - පැතිරුණු, අංජන - අඳුන්, ලෝකය - ජගත්, පියුම් - මහනෙල්
(3) දේව - අසුර, වෙළඳ - වාණිජ, උද්‍යාන - උයන්, නයන - නෙත්
(4) කළල් - වැලි, ඉක්මන් - සෙද, සිංහ - මෘගරාජ, නිති - නිතර

22 මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සතුට - ප්‍රීතිය, ප්‍රහර්ෂය, සොම්නස, ආහ්ලාදය
(2) සක්දෙව් - සුරපති, විදුරවි, තිදසිඳු, දුම්ඳුරු
(3) භූමි - මිහි, ධරණී, පොළොව, මී
(4) පොත - ගත, ග්‍රන්ථය, පුස්තකය, කෘතිය

23 විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ඥාති - මිත්‍ර (2) ලේඛන - භාෂණ (3) අනුමාන - ප්‍රත්‍යක්ෂ (4) ආධුනික - ප්‍රවීණ

24 වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ඓ, ඖ සංයුක්ත ස්වර අක්ෂර ය.
(2) ''සාදනු ලබයි'' යන්න කර්මකාරක වර්තමාන කාල ඒකවචන ක්‍රියාවකි.
(3) පූර්ව ක්‍රියාවක් දෙවරක් යෙදීමෙන් ද මිශ්‍ර ක්‍රියාවක් සකසා ගත හැකි ය.
(4) 'නො හැකි' යන්නෙහි 'නො' යනු උපසර්ගය කි.

25 පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) අවම මව්පිය දූ දරු සබඳතාවය මත දුරස්ථභාවය ඔවුන් අතර වේ.
(2) සංචාරක වැඩි පක්ෂීන්ගේ පැමිණීම අලංකාර පරිසරය වඩවයි.
(3) නාවික යාත්‍රාවක් වෙරළට සේන්දු වෙද්දී ඊට පසුපසින් උස් ජල පාරක් දිස්විය.
(4) එතුමාගේ විස්මිත අදහස් හමුවේ තර්කානුකූල වූ ජනතාව හඬ නැගුහ.

- **අංක 26, 27, යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26 තමා කළ වැරැද්ද තමාට ම දැනීම,

(1) ගඟට ඉනි කැපුවා වගේ.
(2) අබ කෑ මිනිහගෙ නහය දනව වගේ.
(3) අතු කඩා මොර කන්නා වගේ.
(4) මහ මුහුදට දෙහි මිරිකුවා වගේ.

27 අවදානම් ලෙස කටයුතු කිරීම,

(1) දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ.
(2) අගේ ඉඳන් කන කනවා වගේ.
(3) දිය යටින් ගින්දර ගෙන යනවා වගේ.
(4) දැලි පිහියෙන් කිරි කනවා වගේ.

28 ස්වර සන්ධියට හා පරස්වරලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ලකඹර, සුරාසුර (2) යනෙන, සුරඟන (3) ලකඹර, සුරඟන (4) ඔවුනොවුන්, සුරාසුර

- **අංක 29, 30, යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29 (1) සාමාජිකයෝ සියල්ලෝ ම අසුන් ගත්හ.
(2) විනිසුරුවරු පැමිණියහොත් අපි තරගය ආරම්භ කරමු.
(3) එම උපදේශකතුමා පියෙක් වැනි උතුමෙක් ය.
(4) සතුරෝ ආසන්න කඳවුර වටලාගෙන ඇත.

30 (1) සහෝදරයාත් මමත් පැරණි නිවස වෙත ගියෙමි.
(2) වැඩිහිටියෝ සැමදා පිදියයුත්තන් වෙති.
(3) ආයෝජකයන් විසින් නව නිෂ්පාදන ව්‍යාපෘති අරඹන ලදී.
(4) අසල්වැසියෝ සමඟ ගෙහිමියා සාකච්ඡා කරති.

31 • වැසිදිය බැස යන ............ ඔවුහු විමසිල්ලෙන් සිටිති.
• තරගය ආරම්භ වීමත් ............ ප්‍රීතිඝෝෂා පැතිරෙන්නට විය.
• අද නිවාඩු දිනයක් ............ බොහෝ දෙනෙකු පැමිණ ඇත.
• ඩෙංගු රෝගය පිළිබඳ වෛද්‍යවරු ............ සිහිපත් කරති.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) බැවින්, සමඟ, තුරු, නිතර (2) තුරු, සමඟ, බැවින්, නිතර
(3) තුරු, සමඟ, නිතර, බැවින් (4) බැවින්, සමඟ, නිතර, තුරු

32 පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒ ගොල්ලො කඩිමුඩියෙ එද්දි මං පුදුම වුණා.''
(1) ඔවුහු හදිසියේ පැමිණෙද්දී මම පුදුමයට පත් වීමි.
(2) ඔවුන් හදිසියේ පැමිණෙද්දී මම පුදුමයට පත්වීමි.
(3) ඔවුන් හදිසියේ පැමිණෙද්දී මා පුදුමයට පත්වීමි.
(4) ඔවුහු හදිසියේ පැමිණෙද්දී මා පුදුමයට පත්වීමි.

33 ''මංතන්නෝ'' කෙටි කතාවේ කතුවරයා කවුද?
(1) මහගම සේකර (2) ගුණදාස අමරසේකර (3) මාර්ටින් වික්‍රමසිංහ (4) ජී.බී. සේනානායක

34 ''මේ <u>අසේව</u> වැදහොත් වඳුරා මරා මස් කොට අනුභව කිරීමෙන් ශරීරයත් පෘෂ්ටි කොට ගෙන'' මෙහි 'අසේව' යන්නෙහි අර්ථය වන්නේ,
(1) කුසගින්නේ (2) නින්දේ (3) වෙහෙසව (4) විවේකීව

35 රූපකයක් සහිත පද්‍ය පේළිය කුමක් ද?
(1) මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට (2) සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී
(3) හෙළන නගන අත නුවනග බැලුම් දිදී (4) උදුල සොම් කැලුම් නිසයුරු හිමි පුවළ

36 ''පසුගිය නත්තල් කාලේ නිවාඩුවෙයි මං ආවේ
පුංචි බේබි එක්කල පාසල් යන්නයි මං ආවේ''
මෙම කොටස උපුටා ගත් ''පියසේන ඇසූ ප්‍රශ්නයක්'' පැදිපෙළ නිර්මාණය කළේ කවුද?
(1) මොනිකා රුවන් පතිරණ (2) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
(3) රැපියල් තෙන්නකෝන් (4) විමල් දිසානායක

37 තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් රචනා කළ සන්දේශ කාව්‍යයක් වන්නේ,
(1) හංස සන්දේශයයි (2) ගිරා සන්දේශයයි (3) පරෙවි සන්දේශයයි (4) කෝකිල සන්දේශයයි

38 හේන් ගොවිතැනේ දී 'පාවහන්' යන්නට භාවිතා කළ වචනය වන්නේ,
(1) ජාලය (2) වාංපතුල් (3) කුටාලම (4) මාගල

39 ''සාහිත්‍යකරුවා යොදා ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණය වන්නේ **හැඟීම් දැනවීමේ ශක්තිය යි.**'' මෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටස හඳුන්වන පිළිතුර වන්නේ,
(1) ප්‍රතිභාව (2) ව්‍යුත්පත්තිය (3) පරිකල්පනය (4) භාවික ගුණය

40 පහත සඳහන් වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
'බහු සන්නිවේදන මාධ්‍ය ව්‍යාප්තිය හේතුවෙන් සම්මත ව්‍යවහාර ප්‍රචලිත වීමත් සමාන අධ්‍යාපන අවස්ථාත් නිසා වර්තමානය වන විට ප්‍රාදේශීය හා සමාජමය උපභාෂා භාවිතයෙන් ඈත්වනු පෙනේ.'
(1) වර්තමානයේ සමාජීය උපභාෂා හා ප්‍රාදේශීය ව්‍යවහාර අධ්‍යාපනය හා සන්නිවේදනය හේතුවෙන් තවදුරටත් ප්‍රචලිතව ඇත.
(2) ප්‍රාදේශීය ව්‍යවහාර හා සමාජීය උපභාෂා ව්‍යවහාර, භාවිතයට සමාන අධ්‍යාපන අවස්ථා හා සම්මත ව්‍යවහාර එක්වීම තරමක් දුරට බලපා ඇත.
(3) සම්මත ව්‍යවහාර භාවිතයට හේතු වූ සන්නිවේදනයත් සමාන අධ්‍යාපනයත් වර්තමානයේ ප්‍රාදේශීය හා සමාජීය උපභාෂා ව්‍යවහාර ඈත් වීමට හේතු වී ඇත.
(4) බහු සන්නිවේදනවල ව්‍යාප්තිය නිසා සම්මත ව්‍යවහාර සමාජයට එක්වීමෙන් ප්‍රාදේශීය ව්‍යවහාර සමහරක් සමාජයෙන් ඈත්වෙමින් තිබේ.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- **අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) (i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලිවන සේ වාක්‍ය දෙකක් ලියා දක්වන්න.
(අ) නල (ආ) නළ

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
''අනුනායක හිමි අවමංගල උත්සවයේ කතාව සිදු කිරීමට ඉදිරිපත් වූවේ ය.''

(iii) ඉරි ඇඳි පද අයත් ක්‍රියාවර්ගය නම් කරන්න.
(අ) මරුට <u>සිනාසෙවු</u> හෙළයනි මරුට සිනාසෙවු.
(ආ) මහ වැසි <u>වසිද්දී</u> අපි නිවසට දිව්වෙමු.

(iv) පහත දී ඇති පදවල ව්‍යඤ්ජන හා ස්වර වෙන්කර ලියන්න.
(අ) කෞතුක (ආ) වෛද්‍ය

(v) පහත වාක්‍ය වැරදි නම් නිවැරදි කර ලියන්න.
(අ) ඕතොමෝ ආදරයෙන් මව්පියන් රැකබලා ගත්තේ ය.
(ආ) පියාණෝ වනාන්තරයේ දී තාපසයන් වහන්සේ වැන්දේ ය.

(vi) පළමු වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන පරිදි පළමු වචනය හෝ දෙවන වචනය හෝ සකසා ලියන්න.
(අ) බෝ වෘක්ෂය (ආ) සොබා ධර්මය

(vii) සදොස් වචනය නිදොස් කොට එම පදය පමණක් නැවත ලියන්න.
(අ) ප්‍රත්‍යාර්ථ ශබ්ද ලෙස හැඳින්වෙන්නේ තද්ධිත හා කෘදන්ත යි.
(ආ) නර්තන උත්සවයේ රිද්මයානුකූල නර්තනයක් දක්නට ලැබුණි.

(viii) පහත පද විසන්ධි කරන්න.
(අ) දේවේන්ද්‍ර (ආ) නිරවුල්

(ix) පහත දැක්වෙන ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
(අ) මහඑකා (ආ) හේමලයා

(x) පහත යෙදුම් සඳහා ගැළපෙන තනිපද ලියන්න.
(අ) වියදම් අවම කර ගනිමින් කටයුතු කිරීම
(ආ) සියලුදෙනාගේ ම අනුමැතිය ලැබූ

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) රටක සෞඛ්‍ය තත්වය උසස් මට්ටමක පැවතීම එරට සංවර්ධනයට සෘජුව ම බලපානු ලබයි. මේ සඳහා ජනතාවට පෝෂ්‍යදායී ආහාර ලැබිය යුතු ය. එහෙත් බිඳ වැටුණු ආර්ථිකය සමඟ බොහෝ දෙනෙකුට එදා වේල පිරිමසා ගෙන ජීවත් වන්නට සිදුවීම නිසා බොහෝ දෙනෙක් මන්ද පෝෂණයට ගොදුරු විය. මෙරට නිෂ්පාදනය වන ආහාරවත් ජනතාවට අඩු මිලට ලබාගත හැකි විය යුතු ය. ව්‍යායාම කිරීම ද සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ඉතා වැදගත් ය. එහෙත් කාර්යබහුල ජීවිතයේ දී අසීමාන්තික ලෙස මුදල් උපයන්නට සිදුවීමෙන් කායික සුවතාවය මග හැරී ඇත. මානසික සුවතාවය ද සෞඛ්‍ය සම්පන්න ජීවිතයට ඉතා ම වැදගත් වේ. (ලකුණු 25)

(ආ) අපගේ මූලික අවශ්‍යතා අතර ආහාරවලට වැදගත් ස්ථානයක් හිමි වේ. වැඩිවන ජනගහනයේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ආහාර පාන, ක්ෂණිකව, කෘත්‍රිමව පිළියෙල කිරීම නිරතුරුව සිදු වේ. මෙනිසා ම වස විස සහිත ආහාර පාන පරිභෝජනයට ගැනීම නිසා මිනිසා විවිධ රෝගාබාධයන්ට ගොදුරු වෙයි. වස විසෙන් තොර ආහාර පරිභෝජනයට ගෙන නිරෝගී ජනතාවක් බිහිකිරීමට අවධානය යොමු කළ යුතු ව ඇත. මේ සඳහා කාලය එළඹ තිබේ. (ලකුණු 25)

(ඉ) වනාන්තරයෙහි ඇති ජෛව විවිධත්වය සත්ත්ව හා ශාක ප්‍රජාවගේ පැවැත්මට උපකාරී වේ. මිනිසාගේ පැවැත්මට වන ජීවීන්ගෙන් සිදුවන දායකත්වය ඉතා ඉහළ ය. එහෙත් මිනිස් ක්‍රියාකාරකම් නිසා සත්ව ශාක ප්‍රජාවට අත් වී ඇති ඉරණම සුළුපටු නොවේ. වනාන්තර හා සත්ව ප්‍රජාව ආරක්ෂා කිරීමට ලොව පුරා විවිධ සම්මුති, සංවිධාන තිබුණ ද ඒවායේ ක්‍රියාකාරීත්වය ඉතා අල්ප වේ. මේ පිළිබඳව මීට වඩා ගැඹුරින් සලකා බැලිය යුතු ව ඇත. (ලකුණු 25)

(ඊ) ඩෙංගු රෝගය බරපතල සමාජ ගැටලුවක් බවට පත් වී තිබේ. ඒ සමගම බෝවෙන රෝග රැසක් වර්තමානයේ හිස ඔසවමින් තිබේ. ඒ අතර කොරෝනා වෛරස ප්‍රභේද පවා ව්‍යාප්ත වෙමින් පවතී. මේ පිළිබඳව මිනිස් ප්‍රජාව පුළුල් ව දැනුවත් විය යුතු ය. නොදැනුවත් බව ද මේවා ව්‍යාප්ත වීමට එක් හේතුවකි. රෝග වැළඳීමට පෙර ඊට හේතු සොයා පිළියම් යෙදීම ඉතා වැදගත් වේ. මේ පිළිබඳව වහා කටයුතු යෙදිය යුතු ය. (ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 50-60 අතර වන සේ සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

රටක පිහිටීම ඒ රටට ඉතා වැදගත් ය. කිසියම් රටක් යහපත් දේශගුණයක් තිබෙන ප්‍රදේශයක පැවතීම වාසනාවකි. එවිට සීතල හා උෂ්ණත්වය පාලනය කිරීමට අමුතු වෙහෙසක් හෝ වියදමක් දැරිය යුතු නොවේ. ගිනිකඳු, භූමි කම්පා, ස්වාභාවික විපත් අවම වීම ඉතාම වාසිදායක ය. එවිට රජයට රටත් වැසියනුත් පහසුවෙන් පාලනය කළ හැකි ය. සශ්‍රීක පොළොවක් ලැබීම ද වැදගත් ය. එවැනි රටක ඉවත දමන දඬුවක් බීජයක් පවා වහ වහා වැඩෙයි. එමෙන් ම විවිධ බෝග විවිධ කාලවල දී වගා කරමින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ය. අස්වනු වැඩිවීමෙන් රට ඉක්මනින් ම සංවර්ධනය වේ. අප රට අසලින් ගමන් කරන බොහෝ නැව් ඉන්ධන සහ ජලය සොයාගෙන අසල ඇති රටවලට අමතර වියදමක් දරා ගමන් කරයි. හම්බන්තොට ප්‍රදේශයේ නිසි ප්‍රමිතියෙන් යුත් වරායක් තිබුණා නම් මේ රට දියුණු කිරීමේ දුෂ්කර කාර්යය ඉතා ම පහසු වේ. බොහෝ දෙනා මෙරට තුළ නිධානයක් සැඟව ඇතැයි පවසති. ඒ අන් කිසිවක් නොව ඉහතින් කී නොකී කරුණු ය. සියල්ලෝ ම අවංකව ම වෙහෙස වුවහොත් නිධානය ගොඩ ගෙන සුව සේ ජීවත්විය හැකි ය. සියල්ල කළ හැක්කේ අපට ම ය. තමන්ට තමන් අවංක වී ඉගෙන ගන්නා, වැඩ කරන, සිතන පතන දවසක සියලු නිධන් රට තුළින් ම මතුවනු නියත ය. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකය දිනෙන් දින සංවර්ධනය කරා පිය නගන්නේ තාක්ෂණය පෙරටුකොට ගනිමිනි. වර්තමානය වන විට අප ජීවත්වන මේ ලෝකයේ මිනිසුන් ග්‍රහලෝක, මුහුදේ පතුළට සමීප වීම, සුවිශේෂ යාන වාහන යන්ත්‍ර සූත්‍ර සෑදීම, විද්‍යාත්මක උපකරණ නිපදවීම ආදිය තුළින් විශාල දියුණුවක් අත්පත් කරගෙන ඇත. එසේ වුවද බොහෝ දෙනා අවිවේකීව ජීවත් වෙති. ලද දෙයින් සතුටු නොවෙති. මියෙන තුරා ම එකිනෙකා පසු කරමින් යාමට වෙර දරති. අවසානයේ එකතු කළ සියලු දේ ඒ ඒ තැන්වල ම තබා පරිසරයට එකතු වන්නේ නම් ලැබුවේ කවර දියුණුවක් ද? දැනට වසර දහස් ගණනකට පෙර රාවණා යුගය, ඉන්දු නිම්න ශිෂ්ටාචාර යුගය, ග්‍රීසියේ පිරමීඩ යුගය ආදී වශයෙන් බලද්දී වර්තමානයට වඩා අතීතයේ මේ ලෝකය ම දියුණුව පැවති බව පෙනේ. මේ අතීත පාලකයින් ජනතාවගේ කායික සුවය මෙන් ම මානසික සුවය ද අගය කළ බව දක්නට ලැබේ. මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරවල නිවාස ඉදිකර තිබුණේ ප්‍රධාන පාරට මුහුණලා නොවේ. නාන තටාක ද විය. ආලෝක කුළුණු ද මග දෙපස විය. පාරවල් ඍජුව සාදා ඇත. සැලසුම් සහගත නගර එකල නිමවා ඇත. ඒ අනුව දියුණුව කරායාමේ දී ගස්වැල්, සතුන්, ඇළ දොළ ගැන ද සිතිය යුත්තේ ම ය.

(i) ඉහත පාඨයට අනුව වර්තමාන සමාජය දියුණුයැයි පවසන හේතු 02 ක් ලියන්න.
(ii) එය කෙනෙකුට දියුණුවක් යැයි සිතිය නොහැකි ය. ඊට හේතු 02 ක් ලියන්න.
(iii) අතීතයේ මේ ලෝකය දියුණුව පැවති බවට උදාහරණ දෙකක් ලියන්න.
(iv) පහත සඳහන් පදවලට සමාන පද ඡේදයෙන් තෝරා ලියන්න.
(අ) ස්ථම්භ (ආ) ශාරීරික
(v) අතීත පාලකයින් ජනතා සේවය සපයද්දී සැලකිල්ලට භාජනය කළ කරුණු මොනවා ද?

(ලකුණු 2 x 5 = 10)

(05) ඔබ පාසලේ, 2024 වර්ෂයට අදාළ ත්‍යාග ප්‍රදානෝත්සවය මෙම වසරේ ජූලි 30 වන බදාදා දිනයේ පෙ.ව. 9.30 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට නියමිත ය. ඒ සඳහා විද්‍යාලයීය කීර්තිමත් ආදිශිෂ්‍යයින් කිහිපදෙනෙකු ම සහභාගී වේ. එම උත්සවයට අවශ්‍ය අංග ඇතුළත් කරමින් ඒ සඳහා සුදුසු න්‍යාය පත්‍රය සකස් කරන්න.

**නැතහොත්**

බිංගිරිය, බෝවත්ත, වීරපොකුණ ගම්මානයට ළඟා වීමට ඇති එක ම ප්‍රධාන මාර්ගය වසර දහයකින් ප්‍රතිසංස්කරණය කර නොමැත. මෙ නිසා ගම හරහා ගමන් කළ එක ම බස්රථය ද නතර වී දැනට වසර දෙකක් පමණ ගත වී ඇත. පාසල් දරුවන්, රැකියා සඳහා යන්නන්, රෝහලට යන්නා වූ වැඩිහිටියන් දිනපතා පීඩාවට පත්වන අතර තම අස්වනු නගරයට ගෙන යා නොහැකි ව ගොවීහු ද අසරණ ව සිටිති. අබලන් ව ඇති මාර්ගය නැවත තාර දමා පිළිසකර කර දෙනමෙන් ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම්තුමාට යැවීමට සුදුසු ලිපිය ලියන්න. ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් මධුමාල් පෙරේරා යැයි සිතන්න.

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) සද්ධර්මරත්නාවලිය කෘතියෙහි රචකයා නම් කරන්න.
(ආ) සද්ධර්මරත්නාවලිය ලිවීමට පාදක කරගත් කෘතිය කුමක් ද?

(ii) පහත සඳහන් කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

නොගොසින් සිට සිටි වන නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නොමඳේයා

(අ) ...........................................................................
(ආ) ...........................................................................

(iii) ''හිස් බැල්මෙන් බලාගත් අත බලාගෙන අතක් පයක් නොසොල්වා පැය ගණනක් එක තැනකට වී හිඳිති.''

(අ) ඉහත කොටස ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙම කොටස ඇතුළත් වන්නේ එම කෘතියේ කීවන පරිච්ඡේදයේ ද?

(iv) සැප සයනා සුවඳ බොජුන් - තුමුල මාලිගා
ඈ සම්පත් හැරදා ඇයි - මෙලෙස වෙසෙන්නේ

(අ) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) එම කොටස ඇතුළත් නිර්මාණයේ රචකයා කවුරුන් ද?

(v) ''යා හිමි, ම පුතු ගෙනැ එ'' යි කිව.

(අ) ඉහත කොටස ඇතුළත් වන්නේ කුමන කෘතියේ ද?
(ආ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?

(vi) (අ) එස්. මහින්ද හිමි ලියූ ප්‍රථම කාව්‍ය කෘතිය කුමක් ද?
(ආ) මහින්ද හිමි කවි ලියූ තේමාවක් නම් කරන්න.

(vii) පහත කවියෙහි හිස්තැනට අදාළ කවි පද සම්පූර්ණ කරන්න.

(අ) ...........................................................................
(ආ) ...........................................................................

කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
වයි යා කරන් මල්තුරු ගන වන හිසින

(viii) 'ජඩය, මැත නොදොඩා තොයිත් තාගේ පණ නො නසා යන අතෙක නැඟී යා.''

(අ) ඉහත කොටසේ 'ජඩය' ලෙස අමතා ඇත්තේ කවුරුන් හට ද?
(ආ) එසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවුරුන් ද?

(ix) (අ) සංයුත්ත නිකායට්ඨ කථාව වන පරමත්ථ ජෝතිකාව ලියවූයේ කුමන යුගයේ ද?
(ආ) දෙවොල් මඩු, ගම්මඩු යන කවි ගායනා කළේ කුමන කාර්යයක දී ද?

(x) (අ) සැළලිහිණි සන්දේශ කෘතියේ රචකයා නම් කරන්න.
(ආ) සැළලිහිණි සන්දේශයේ අන්තර්ගත පද්‍ය ගණන කීයද?

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ගුත්තිල මහ **සිපී**
**සක් දෙව් බසින්** සැතපී
මින් දින මැයි දැපී
බමර තත පළමුවෙන් සිඳපී

(අ) කළු අකුරින් මුද්‍රිත පද දෙකෙහි අර්ථය වෙන වෙන ම ලියන්න.
(ආ) මුළු කවියේ ම සමස්ත අර්ථය ලියා දක්වන්න.

(ii) ''මහණෙනි, ම පුතුන් වැන්නවුන්ට බයක් කොයින් දැ?''

(අ) ඉහත ප්‍රකාශයේ 'ම පුතුන්' යනු කවුරුන් ද? එම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) ඉහත ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) ඔහු වියපත් කල්හි මවුපියෝ ශිල්ප උගන්නට තක්සලා නුවර නගා යවූහ. හෙ **<u>ධර්මාන්තෙවාසික</u>** වැ ශිල්ප උගන්ති. වත්සපනැ කී කී දෑයක් වහා සපයයි. මන වඩන නියායෙන් හැසිරෙයි. පෙම් වඩන නියායෙන් **බෙණෙයි.**

(අ) කළු අකුරෙන් මුද්‍රිත පද දෙකෙහි අර්ථය වෙන වෙනම ලියන්න.
(ආ) සමස්ත කොටසේ අර්ථය සරල බසින් ලියන්න.

(iv) පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

(අ) ඉහත පද්‍යයේ උපමාවක් යෙදී ඇති පාඨය උපුටා ලියන්න.
(ආ) ඉහත පද්‍යයෙන් පැවසෙන ආකාරයට දක්නට ලැබෙන විශේෂ දෑ මොනවා ද?

(v) ''මං අහපු ආරංචියක් නැහැ. කාගෙන්ද ආරංචි අහන්නෙ?''

(අ) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද? එයට සවන් දෙනු ලැබුයේ කවුරුන් ද?
(ආ) ඉහත ප්‍රකාශය කළ අයගේ ඊළඟ ප්‍රකාශය වූයේ කුමක් ද?

(ලකුණු 4 x 5 = 20)

(03) (i) අපරාධකරුවෙකුගේ ක්‍රියාකාරීත්වය නිසා ජන ජීවිත අඩාල වන ආකාරය දැක්වීමටත්,
(ii) අවස්ථා හා සිද්ධි නිරූපණයටත්, හොඳ ම නිදසුනකි අඟුල්මල් දමන කතාව. එක් කොටසකට නිදසුන් දෙකක්වත් සපයමින් විස්තර කරන්න.

**නැතහොත්**

සැළලිහිණි සන්දේශ කතුවරයා,
(i) විවිධ අවස්ථා වර්ණනයටත්,
(ii) වන වැනුම්වලදී ස්වභාවෝක්තියට මුල් තැනක් දීමටත්,
දක්වා ඇති සමත්කම එක් කරුණකට උදාහරණ දෙකක්වත් දක්වමින් ඔබට නියමිත පාඩම ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(04) උම්මග්ග ජාතක කථාවේ මහෞෂධ පඬිතුමාගේ හා කේවට්ට බමුණාගේ,
(i) සමානතාත්
(ii) විෂමතාත්
දක්වා ඇත. එක් කොටසකට උදාහරණ දෙකක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) අවස්ථාවට උචිත ලෙස වීරිත වෙනස් කර ඇති ආකාරයත්,
(ii) සක්දෙව් රජුගේ උපකාරයෙන් ගුත්තිල ගාන්ධර්වයා තම ගෝලයා පරාජය කළ ආකාරයත්,
ගුත්තිල කාව්‍යයේ ඔබට නිර්දිෂ්ට කොටසින් එක් කොටසකට උදාහරණ දෙකක් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

(05) කුරක්කන් වගාවේ දී ගොවියා අප්‍රමාණ වෙහෙසක් දරයි. විවිධ අභියෝගවලට මුහුණ දෙයි. එම අභියෝග වෙහෙස දරමින් ඔහු ජයගනියි. ඔබට නියමිත පාඩම ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(06) පුද්ගල චරිත සංවර්ධනයෙහිලා නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කළ කවියෙක් ''මුනි සිරිපා සිඹිමින්නේ'' පද්‍ය නිර්මාණයේ දී අපට හමුවේ. මේ කියමන උදාහරණ තුනක් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(07) උග්ගසේන ජීවිතයේ අභියෝග ජයගත් අයෙකු බව උග්ගසේන කතා වස්තුව තුළින් පැහැදිලිය. මෙම කියමන උදාහරණ තුනක් දක්වමින් සනාථ කරන්න.

(ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (4) | 21 - (1) | 31 - (2) |
| 2 - (3) | 12 - (2) | 22 - (2) | 32 - (2) |
| 3 - (1) | 13 - (3) | 23 - (1) | 33 - (1) |
| 4 - (4) | 14 - (1) | 24 - (4) | 34 - (3) |
| 5 - (2) | 15 - (2) | 25 - (3) | 35 - (4) |
| 6 - (3) | 16 - (4) | 26 - (2) | 36 - (1) |
| 7 - (1) | 17 - (4) | 27 - (4) | 37 - (3) |
| 8 - (2) | 18 - (3) | 28 - (3) | 38 - (2) |
| 9 - (4) | 19 - (1) | 29 - (1) | 39 - (4) |
| 10 - (2) | 20 - (3) | 30 - (3) | 40 - (3) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (i) (අ) මඳ නල / සුළඟ (ආ) ජල නළ
(ii) අනුනායක (අනු), අවමංගල (අව) (iii) විධි ක්‍රියා, අසම්භාව්‍ය (කාලාර්ථය)
(iv) (අ) ක් + ඖ + ත් + උ + ක් + අ(ආ) ච් + ඓ + ද් + ය් + අ
(v) (අ) ඕතොමෝ ආදරයෙන් මව්පියන් රැකබලා ගත්තා ය.
(ආ) පියාණෝ වනාන්තරයේ දී තාපසයන් වහන්සේ වැන්දෝය. / වැන්දහ.
(vi) (අ) බෝ රුක / බෝධි වෘක්ෂය (ආ) සොබා දහම / ස්වභාව ධර්මය
(vii) (අ) ප්‍රත්‍යයාර්ථ (ආ) රිද්මානුකූල
(viii) (අ) දේව + ඉන්ද්‍ර (ආ) නි + අවුල්
(ix) (අ) පාවහන් (ආ) සෙවණැල්ල
(x) (අ) අරපිරිමැස්ම (ආ) ඒකච්ඡන්දය

(ලකුණු 20)

02
- සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
- සංවිධානය, නිර්මාණාත්මභාවය හා ස්වීයත්වය ලකුණු 12
- ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා බෙදීම ලකුණු 05

මුළු ලකුණු 25 යි.

නියමිත වචන ප්‍රමාණය සහ ඉහත නිර්ණායක සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

03 ලකුණු විග්‍රහය (සාරාංශය)
1. අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06
2. වචන ගණන - ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02

අන්තර්ගතය
* රටක පිහිටීම සහ එහි දේශගුණයේ වැදගත්බව.
* ස්වාභාවික විපත් අවම වීම ඉතා වැදගත්බව.
* සශ්‍රීක පොළවක ඇති වැදගත්කම
* සරු අස්වනු සහ රටෙහි සංවර්ධනය.
* හම්බන්තොට වරායෙහි ඇති වැදගත්බව.
* රටක් සංවර්ධනයට සියලු දෙනා එකාවන්ව වෙහෙසිය යුතු බව.

04 (i) මුහුදේ පතුළට සමීප වීම / සුවිශේෂ යාන වාහන යන්ත්‍ර සූත්‍ර සැදීම ආදිය.
(ii) අවිවේකීබව / ලද දෙයින් සතුටු නොවීම / පරිසර දූෂණය ආදිය
(iii) රාවණා යුගය / ඉන්දු නිම්න ශිෂ්ටාචාරය / ග්‍රීසියේ පිරමීඩ යුගය
(iv) අ) කුළුණු (ආ) කායික
(v) කායික මානසික සුවය / සැලසුම් සහගත නගර / පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම

(ල. 2x 5 = 10)

05 රාජකාරි ලිපිය
(1) ආකෘතිය - යවන්නාගේ ලිපිනය / දිනය - ලකුණු 01
ලබන්නාගේ ලිපිනය - ලකුණු 01
මාතෘකාව - ලකුණු 01
අවසානය - ලකුණු 01
(2) අන්තර්ගතය
* ප්‍රධාන මාර්ගය අබලන් බව.
* බස් රථය නතර වී ඇති බව.

* පාසල් දරුවන්, රැකියා සඳහා යන්නන්, වැඩිහිටියන් අපහසුතා විඳින බව
* ගොවීහු අසරණ වී අයුරු
* වසර දහයකින් මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීම.
* අබලන් වූ මාර්ගය නැවත සැකසීම.
* තාර දමා පිළිසකර කර දෙන ලෙස ඉල්ලීම.
* කාරුණිකව ඉල්ලීම සිදු කිරීම.

නැතහොත්

(3) ශිල්පීය දක්ෂතා
අත් අකුරු, පද බෙදීම, උක්තාඛ්‍යාත මනාව ගැළපීම

න්‍යාය පත්‍රය -

| | | | |
|---|---|---|---|
| (1) ආකෘතිය | - | මාතෘකාවට | ලකුණු 01 |
| | | න්‍යාය පත්‍රය | ලකුණු 01 |
| | | දිනය | ලකුණු 01 |
| | | විද්‍යාලයීය නම / ලිපිනය | ලකුණු 01 |
| | | | මුළු ලකුණු 04 |

(2) අන්තර්ගතය -
* විශේෂාංග 14 - 16 ක් වත් ඇතුළත්ව පැවතීම.
* ආරම්භයේ සිට අවසානය දක්වා මනාසේ ගළපා ඇති අන්දම සහ අන්තර්ගත විශේෂාංග සලකා බලා ලකුණු 08 ප්‍රධානය කරන්න.

(3) ශිල්පීය දක්ෂතා සඳහා පෙර සේ ලකුණු 03 ක් ප්‍රදානය කරන්න.

## III කොටස

01 (i) (අ) ධර්මසේන හිමි (ආ) පාලි ධම්ම පදට්ය කතාව
(ii) (අ) සතොසින් විද විඳ ලොබ නොසිදේයා (ආ) මෙලෙසින් වෙණ නද අසන සදේයා
(iii) (අ) බැද්දේගම (ආ) 9 වන පරිච්ඡේදය
(iv) (අ) සිංහබාහු (ආ) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
(v) (අ) අමාවතුර (ආ) මන්තාණි බැමිණි
(vi) (අ) ඔවාමුතු
(ආ) ළමයින් උදෙසා ලියූ කවි / දේශානුරාගය හා ජාතිකාභිමානය / බුද්ධාභිවන්දනා
(vii) (අ) අයි රාවණ වුවත් නවතන රිසින් එන (ආ) අයි රා දහස් දිළි දුනු කොත් සිපත් ගෙන
(viii) (අ) කේවට්ට බමුණා හට (ආ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමාගේ සේනාව
(ix) (අ) අනුරාධපුර යුගයේ (ආ) බලිතොවිල් හා ශාන්තිකර්ම වලදී
(x) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (ආ) 108 යි

(ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) • මහසිපී → මහා ශිල්පියා • සක් දෙව් බසින් → ශක්‍ර දේවේන්ද්‍රයාගේ වචනයෙන්
(ආ) ගුත්තිල මහා ශිල්පියා සක් දෙවිඳුගේ වචනයෙන් සන්තෘප්තව මෙයින් දිනමි'යි එඩිතකරව ආඩම්බරයෙන් වීණාවේ ප්‍රධාන තන්තුව කඩා දැමීම.

(ii) (අ) උග්ගසේන මහරහතන් වහන්සේ / බුදුරජාණන් වහන්සේ
(ආ) උග්ගසේන තෙරුන් වහන්සේගෙන් උණ දණ්ඩෙන් බසින විට බයක් නැති දැයි එක් භික්ෂූන් වහන්සේ නමක් ඇසූ විට බයක් නැති බව උග්ගසේන තෙරුන් පැවසූ විට එය බුදුරජාණන් වහන්සේ වෙත දන්වා සිටි විට බුදුරජාණන් වහන්සේ ඒ සඳහා පිළිතුරු දුන් අවස්ථාව.

(iii) (අ) • ධර්මාන්තෙවාසිකව - ගුරුවරයා සමීපයේ සිටිමින් ධර්මයට අතවැසිව / ගුරුවරයාට උවටැන් කරමින්
• බෙණෙයි - කතා කරයි
(ආ) ඔහු වයසින් මුහුකුරා ගිය විට දෙමාපියෝ ශිල්පය ලබා දීමට තක්සලා නුවරට යැවූහ. ඔහු ගුරුවරයාට උවටැන් කරමින් ඉගෙනුම ලබයි. යහපත් ගති පැවතුම් ඇතිව කියන කියන දෙයක් ඉක්මනින් ඉටු කරමින් සිත් ඇද ගන්නා ආකාරයට හැසිරෙමින් ආදරය ඇතිවන ආකාරයට කතා කරයි.

(iv) (අ) දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
(ආ) සුවඳැල් වී වගා කළ කුඹුරු / ළමා වසු පැටියන් / දිව්‍ය විමනක් බඳු වූ වෙහෙර (කරුණු දෙකක්වත් තිබිය යුතුය)

(v) (අ) පුංචිරාළ වෙදරාල / අලුත් ගම් මුලාදෑනි
පුංචි මැණිකා
(ආ) උඹට ආරංචියක් දැනගන්ට ඕනෑ නම් ඒකට යන්න ඕනෑ හිර ගෙදරට (ලකුණු 4 x 5 = 20)

03 අඟුල්මල් දමනය -
(1) අපරාධකරුවකුගේ ක්‍රියාකාරීත්වය නිසා ජන ජීවිතය අඩාල වීම.
* මිනිසුන්ට සිය දෛනික කටයුතු කරගැනීමට නොහැකි වීම. ''හේ හැම ආරණ්‍යයෙහි හසර නැති කෙළේ...,''
* මිනිසුන්ට තම නිවසෙහි පවා ආරක්ෂාව අහිමි වීම. ''රෑ ගමට වැද පයින් පැහැරැ දොර ගලවා පියා එහි හොතුවන් මරා පියා එකෙකැ දෙකෙකැයි ගැණැගෙන යෙයි''
* මිනිසුන් ගම් බිම් හැර ආරක්ෂිත ස්ථාන කරා යාම. ''තුන් යොජනක් තන්හි මිනිස්සු ගෙපියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳ...''
(ii) අවස්ථා හා සිද්ධි නිරූපණය
* හේ ධර්මාන්තේවාසිකව ශිල්ප උගන්නී, වත්සපනැ, කී කී දෙයක් වහා සපයයි. මන වඩන නියායෙන් හැසිරෙයි.
* 'පුතැ මිනිස් දහසක් මැරුව මැනැවැ. එසේ වන්නා ශිල්පයට උපචාර කළා වේ' යැ, කීය.
* හේ පඤ්චායුධ ගෙනැ ආචාර්යවරයා වැඳ, අටවියට වැද, අටවියට වදනා තන්හි දු අටවිය මධ්‍යයෙහි දූ අටවියෙන් නික්මෙන තන්හි දු සිට මිනිසුන් මරයි.
* මහණ ඒ මග නොයා. ඒ මග අඟුල්මල් නම් සොරෙකැ. දරුණු ලෙහෙ මුඩු අත් ඇත්තේ යැ.
* සොර ක්ලාන්ත වී යැ. මියෙහි කෙළ හිඳී ගියේ. ශරීරයෙන් ස්වේද බස්සී.

**නැතහොත්**

සැළලිහිණි සන්දේශය -
(1) අවස්ථා වර්ණනය -
* සුරරද සමන් සමගින් සුරගන එවර
* ගනේ මිණිබැබලි කිරණෙච් සතපාය
* වළඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
* අග පිපිමල් මලිගිය ලිය කැලේයා
* වනසිරි පියුම් රා බඳ රණ බරණ යුරු
(ii) ස්වභාවෝක්ති
* සන්නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
* අග පිපිමල් මලිගිය ලිය කැලේ යා.
* රිවි තැවුලේ පිපි කමලේ විල ගැවසී ලකුණු - නිදසුන් 4 සඳහා ල. 04 යි.
සමස්තය පැහැදිලි කිරීමට ල. 11 යි.
මුළු ලකුණු 15 යි.

04 උම්මග්ග ජාතකය
කේවට්ට හා මහෞෂධ පඬිතුමාගේ චරිතවල,
(i) සමානතා :
* දෙදෙනම රජුගේ පුරෝහිතයන් වීම.
* උපක්‍රමශීලී බව.
* නොපසුබට උත්සාහය
(ii) විෂමතා :
* වයස
* කුලය
* කේවට්ට බලයට ධනයට තණ්හාවෙන් ආත්මාර්ථකාමී වූ අතර මහෞෂධ පඬිතුමා පරාර්ථකාමී වීම.
* මහෞෂධ පඬිතුමා උතුම් මානුෂීය ගුණධර්මයන්ගෙන් පරිපූර්ණ වන අතර කේවට්ට එසේ නැත.
* මහෞෂධ පඬිතුමා නිර්භීතය. කේවට්ට බමුණා බියගුලු ය.
* මහෞෂධ පඬිතුමා ගෞරවයට හා කීර්තියට පත්විය.
* කේවට්ට බමුණා හාස්‍යයට හා උපහාසයට පත්විය.
(ඉහත කරුණුවලට අදාළ උදාහරණ සැලකිල්ලට ගන්න.)

**නැතහොත්**

(i) අවස්ථෝචිතව විරිත් වෙනස් කිරීම
* ගී කාව්‍ය විරිත 1 - 13 දක්වා කවි
* පෙද විරිත 14 - 32 දක්වා කවි
* විසිහයමත් විරිත 33 - 34 කවි

(ii) සක්දෙව් රජුගේ උපකාරයෙන් ගුත්තිල පඬිතුමා ජයගත් බව

* අප බෝසතුන් මිස අනෙකෙකු නොම අසන ලෙස
* ගුත්තිල මහා සිපී සක්දෙව්බසින් සැතපී
* සුන් ඒ තතින් එ සඳ
* පටන් සුරිඳු දුන් උපදෙස් සිහිකොට

ලකුණු - නිදසුන් 4 සඳහා ල. 04 යි.
සමස්තය පැහැදිලි කිරීමට ල. 11 යි.
මුළු ලකුණු 15 යි.

05, 06, 07 ප්‍රශ්න සඳහා උචිත නිදසුන් හා කරුණු සලකිල්ලට ගනිමින් ලකුණු ලබාදෙන්න.
නිදසුන් 3 සඳහා ලකුණු 03 යි.
සමස්තය පැහැදිලි කිරීමට ලකුණු 07 යි.
මුළු ලකුණු 10 යි.